// logo omitted

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1849/30 - 2014 පෙබරවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2014.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ අංකය: දො/ඉ/1/අත්/අධි/103.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගමගොඩ ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක ක4442 සහ 2013.11.28 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 වශයෙන් පෙන්නුම් කෙරෙන මුලු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0033 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැලි දෙක(02).

1. කැබලි අංක 1
ඉඩමේ නම: අම්පිටියකැලේ; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ඒ. විමලසිරි, ගමගොඩ, උඩුපිටිගොඩ; ප්‍රමාණය: හෙක් 0.0005.

2. කැබලි අංක 2
ඉඩමේ නම: අම්පිටියකැලේ; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. එල්. ඩී. සෝමසිරි, ගමගොඩ, උඩුපිටිගොඩ; ප්‍රමාණය: හෙක් 0.0028.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2014 මාර්තු මස 27 වැනි දින පූ.භා 10.00 ට දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද 2014 මාර්තු මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. ඩබ්. ටී. ආර්. වෙත්තසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දොඩන්ගොඩ.

2014 ජනවාරි මස 30 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

02-848

1A - G 019057 - 85 (2014/02)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.